**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2022**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් අපනයනකරුවන් සඳහා ලබා දී තිබුණු අපනයන ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන් 148 දෙනෙකු වෙතින් අයවිය යුතු මුදල රු.38,174,012 ක් විය. එම මුදලින් සියයට 97 ක් එනම්, රු.36,978,012 ක් වර්ෂ 24 ක් පැරණි ණය ශේෂ වූ අතර, එය අපනයනකරුවන් 147 කගෙන් අය විය යුතුව තිබුණි. ඉතිරි සියයට 3 ක වටිනාකම එනම්, රු.1,196,000 වර්ෂ 16 ක් පැරණි ණය ශේෂයක් වූ අතර, එය එක් අපනයනකරුවකුගෙන් අය විය යුතුව තිබුණි. | එකී සමාගම් වලින් අය විය යුතු රු. 38,174,012 ක මුදල දැනට ක්‍රියාත්මක වන සමාගම් මඟින් අයකර ගැනීමට කටයුතු කරමින් සිටිනු ලබන අතර, වර්තමානයේ ක්‍රියාත්මක නොවන සමාගම්වලින් අය විය යුතු ණය කපා හැරීම සඳහා විගණන කමිටුවේ නිර්දේශ මත මණ්ඩල රැස්වීමේදී ලබා ගත් එකඟතාවය අනුව මුදල් අමාත්‍යාංශය වෙත අදාල ණය කපා හැරීම සඳහා අනුමැතිය සඳහා යොමු කර ඇත | අය විය යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) මණ්ඩලය විසින් සමාගම් දෙකක් සඳහා රු.1,450,743 ක අපනයන ණය ලබා දී තිබුණු අතර එම සමාගම් දෙකෙහි කොටස් ආයෝජනය සඳහා රු.4,853,000 ක මුදලක් යොදවා තිබුණි. එසේ වුවද, එම සමාගම් දෙක වර්තමානය වන විට අක්‍රියව වසා දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම සමාගම් දෙකෙන් අය විය යුතු මුදලේ එකතුව රු.6,303,743 ක් විය. | මණ්ඩලය විසින් කොටස් ආයෝජනය කර ඇති සහ අපනයන ණය ලබා දී ඇති සමාගම් දෙක වර්තමානය වන විට අක්‍රියව වසා දැමූ සමාගම් වන හෙයින් දැනට ගෙන ඇති නීතිමය පියවර ඉදිරියට ගෙන යාමට කටයුතු කෙරේ. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන වෙනුවෙන් ලබාදී තිබුණු රු.10,403,683ක් 2009 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ෂ 13 ක කාලයක් තුළ නැවත අයකරගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | වර්තමානයේ මෙම වැඩසටහන අක්‍රීය තත්ත්වයේ පවතින අතර, ඊට අදාල තොරතුරුවල පවතින අඩුපාඩු හේතුවෙන් මේ වන විට අදාල මුදල් අය කර ගැනීමට නොහැකි වී ඇත. | අය විය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර, අයකර ගත නොහැකි ශේෂ සම්බන්ධයෙන් |

| | | | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
|---|---|---|---|

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මණ්ඩලය විසින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සිදු කරන ලද ආයෝජනවල එකතුව 2022 දෙසැම්බර් 31 දිනට රු.53,490,41ක් විය. | DHPL ආයතනයට ගෙවිය යුතු ගොඩනැගිලි කුලීය මණ්ඩලය විසින් තම ආදායමෙන් පියවා ගැනීමට ඉඩ හරිමින් ලබා දෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමා කර ඇත. ඒ අනුව ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමේ අරමුණින් මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන හැර මණ්ඩලය වෙත ලැබෙන අනෙකුත් අදායම්වලින් අතිරික්ත මුදල් සහ ඉදිරි සංවර්ධන වැඩසටහන් සඳහා අපනයන කරුවන්ගෙන් එක් රැස් කරන මුදල් ඉදිරියේදී ගෙවීම් කරන තෙක් ජංගම ගිණුමේ රඳවා ගැනීම වෙනුවට පොලී ආදායමක් ලබා ගැනීමේ අරමුණින් විගණන කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව රු. 53,490,411 ක මුදලක් ස්ථාවර තැන්පතු (Fixed deposits) සහ රු. 10,000,000 ක මුදලක් ඇමතුම් තැන්පතු (call deposits) වල තාවකාලිකව ආයෝජනය කර ඇත. එම ස්ථාවර තැන්පතු මුදල සහ තැන්පතු සඳහා ලැබෙන පොලී මුදල් යොදාගෙන 2022 වර්ෂයේ ගොඩනැගිලි කුලී ගෙවීමට කටයුතු කෙරේ. | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය | සෑම මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන | මණ්ඩලය විසින් චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අවස්ථා දෙකෙන් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව, එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, මණ්ඩලය සතු වාහන 22 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.218,857,086 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.211,709,684 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,147,402 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන සහ වෙනත් ලැබිය යුතු දෑ සඳහා හානිකරණ අධි ප්‍රතිපාදනය රු.137,038,488 කින් වැඩි වීම සහ ආශ්‍රිත සමාගමේ ලාභ කොටස රු.119,190,431 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් සමාගම් 29ක රු. 105,117,478 ක් වූ නිදහස් කළ හැකි වරණීය කොටස්වල හා සමාගම් 34 ක රු. 56,332,354 ක් වූ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 18 ක කාලපරිච්ඡේදය තුළ වරණීය කොටස් සඳහා කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර, ක්‍රියාකාරී සමාගම් 14 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කරන ලද එකතුව රු. 9,183,784 ක ආයෝජිත මුදල වෙනුවෙන්ද කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. | මණ්ඩලය විසින් නිදහස් කල හැකි වරණීය කොටස්වල ආයෝජිත සමාගම් වලින් කිසිදු ලාභාංශ මුදලක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර දැනට ක්‍රියාකාරී තත්වයේ පවතින නමුත් ලාභාංශ ලබා නොදුන් සමාගම්වල මූල්‍ය සහ මෙහෙයුම් තත්ත්වය පිළිබඳ සොයා බලා ඉදිරියේ දී ලාභාංශ ආදායම් මණ්ඩලය වෙත ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා කටයුතු කරමින් පවතී.<br>එසේම මණ්ඩලය විසින් එකී සමාගම්හි ආයෝජනය කරන ලද මුදල් අය කර ගැනීමට ගත හැකි විසඳුම් ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කරන බවත්, එම මුදල් අය කර ගැනීමට වර්තමානයේ පියවර ගනිමින් සිටින බවත් වැඩිදුරටත් සඳහන් කර සිටිමි. | වත්කම් සම්බන්ධයෙන් උපරිම ප්‍රතිලාභ ලබා දෙන ඵලදායි ආයෝජන තීරණ ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 487(4) ඡේදය ප්‍රකාරව සමාගම්වල කොටස්හිමිකරුවෙකු ලෙස ගත යුතු ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් මණ්ඩලය විසින් වරණීය කොටස් හා සාමාන්‍ය කොටස්වල ආයෝජිත එකතුව රු.89,469,028 ක් ආයෝජනය කරන ලද සමාගම් 28 ක නාමයන් සමාගම් රෙජිස්ටරයෙන් කපා ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | 2022 දෙසැම්බර් 31 වන දිනට නිදහස් කල හැකි වරණීය කොටස්වල සහ සාමාන්‍ය කොටස්වල ආයෝජිත දැනට අක්‍රියව පවතින සමාගම් අතරින් සමාගම් පනතේ 487 වගන්තිය යටතේ කපා හරින ලද සමාගම් සම්බන්ධයෙන් 2007 අංක 7 දරන පනත බලාත්මක වූ අවධියේදී මාස 06 ක කාලයක් තුළ නව අංකයක් ගැනීමට ඉල්ලීමක් කර යුතුව තිබූ අවස්ථාවේදී අදාල සමාගම් සම්බන්ධයෙන් නව අංකය ලබා ගැනීමට ඉල්ලීමක් සිදු කර ඇත්ද යන්න පිළිබඳ සාධක සොයා ගැනීමට අපහසුව ඇත.<br>මණ්ඩලය විසින් තවදුරටත් එම ආයෝජනය කර ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ දත්ත රැස් කරමින් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරමින් සිටින බව වැඩිදුරටත් සඳහන් කර සිටිමි. | ආයෝජන වල ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා කාලීන හා කාර්යක්ෂම කළමනාකරණ තීරණ ගත යුතුය. |
| (ආ) මණ්ඩලය වෙත සේවා ලබා ගැනීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව ආයතන 07 ක කරන ලද තැන්පතු එකතුව රු.901,000 කට අදාල ගිවිසුම් අවසන් වී වර්ෂ 07 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණද එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය විසින් සේවා සඳහා කරන ලද එකතුව රු.901,000 ක් වූ තැන්පතු 7කට අදාල සැපයූ සේවා ලබා ගැනීම ඇවර කර ඇති හෙයින් නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඒ අනුව අදාල තැන්පතු නැවත අයකර ගැනීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන ඇතත් ඒ සඳහා පවතින අවිනිශ්චිත බව සලකා හානිකරණ වෙන් කිරීම් සිදු කර ඇත. | අය විය යුතු ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ)දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන වෙනුවෙන් අත් පත්‍රිකා මුද්‍රණය කරවා ගැනීම සඳහා තෝරා ගත් සැපයුම්කරු සමඟ 2021 අප්‍රේල් 07 දිනැතිව ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව තෝරාගත් සැපයුම්කරු අදාල කාර්ය ඉටුකිරීමට අපොහොසත් වූ බැවින්, | මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙන්ම භෞතික සාකච්ඡා පවත්වා මෙම අත්පත්‍රිකාවල ගුණාත්මකභාවය ඉහළ නංවා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරුව ද සැලසුම් මණ්ඩලය බලාපොරොත්තු වූ මට්ටමට ගෙන ඒමට ඔවුන් | අදාල පාර්ශවයන්ගෙන් අලාභ අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු.1,189,375 ක් වූ බදු රහිත ඇණවුම් වටිනාකමින් ගෙවන ලද අත්තිකාරම් මුදල රු.237,875 ක් හා ගිවිසුමේ 3.6 වගන්තිය ප්‍රකාරව රු.300,000 ක ඇවර කරන ලද අලාභ (Liquidated Damages) අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අපොහොසත් වූ හෙයින් එම කාර්ය අත්හිටුවීමට කටයුතු කරන ලදී.<br>ගිවිසුම් ගත ආයතනය වෙත ගෙවූ අත්තිකාරම් මුදල වන රු. 237,875 ක් නැවත ගෙවන ලෙස ඉල්ලීම් කළ ද ඔවුන් ඒ සඳහා ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මේ වන විට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ මාධ්‍ය අංශය වෙත නව වීඩියෝ කැමරාවක් සහ ඩිජිටල් SLR කැමරාවක් මිලට ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ රු.මිලියන 2.1 ක් ප්‍රතිපාදනයක් කර තිබුණු අතර, ප්‍රසම්පාදන කටයුතු 2017 මාර්තු මස ආරම්භ කර තිබුණද, අවස්ථා කීපයකදී තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙනස් කිරීම, එම කමිටු ක්‍රියාත්මක නොවීම හා ප්‍රසම්පාදන කමිටු ක්‍රමානුකූලව නොපැවැත්වීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමට වසර 05 කට වැඩි කාලයක් ගත වී තිබුණි. 2022 වර්ෂයේදී තෝරා ගත් සැපයුම්කරුට අනුව වීඩියෝ කැමරාවෙහි සහ ඩිජිටල් SLR කැමරාවෙහි වටිනාකම් එකතුව රු.4,385,500 ක් වූ අතර, ප්‍රසම්පාදන කටයුතුවල කාල පමාව හේතුවෙන් භාණ්ඩවල මිල ඉහළ යාම නිසා පවතින සීමාව තුළ මිලදී ගත හැකිවූයේ රු.2,086,700 ක් වටිනා ඩිජිටල් SLR කැමරාව පමණි. | මාධ්‍ය අංශය වෙත නව වීඩියෝ කැමරාවක් සහ ඩිජිටල් SLR කැමරාවක් මිලදී ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ ප්‍රම්පාදන කටයුතු ආරම්භ කලද එවකට ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා තිබූ අරමුදල් හිඟතාවය සලකා පැවති කැමරාවල තත්වය නිරීක්ෂණය කර නව කැමරා මිලදී ගැනිම එම අවස්ථාවේ නොකිරීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදි. කෙසේ වුවද 2021 වර්ෂය වන විට පැවති කැමරාවන්හි පැවති තාක්ෂණික දෝෂමත භාවිතා කිරීමට සුදුසු තත්වයේ නොතිබූ හෙයින් 2022 වර්ෂයේදී පැවති කැමරා යුගලය වෙනුවෙන් වීඩියෝ සහ නිශ්චල ඡායාරූප ලබා ගැනීමේ පහසුකම් වලින් හෙබි නව තාක්ෂණික පහසුකම්වලින් යුත් උසස් තත්වයේ කැමරාවක් මිලදී ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරන ලද කාල සීමාව තුළ අවසන් කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙළඳ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත සංවර්ධන නිලධාරීන් 299 ක් අනුයුක්ත කර තිබුණු අතර, ඉන් 14 ක් මණ්ඩලයේ | සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය පිළිබඳ අප සමග කිසිදු සාකච්ඡාවක් සිදු නොකර අදාල | අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු සහිත |

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයට ද, 16 ක් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට ද, ඉතිරි 269 ක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ද අනුයුක්ත කර තිබුණි. ඉන් ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් 285 දෙනා විසින් ප්‍රමාණවත් රාජකාරියක් ඉටු කරනු ලබන බව විගණනයේදී අනාවරණය නොවුණි. | රේඛීය අමාත්‍යාංශ හරහා වරින් වර අනුයුක්ත කොට ඇත. ඒම නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහ අදාල රේඛීය අමාත්‍යාංශයේ අභිමතය පරිදි සිදු වේ. මෙම සංවර්ධන නිලධාරීන් ප්‍රමාණය අපගේ සේවා අවශ්‍යතාවයට වඩා වැඩි බව අප විසින් අදාල රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කොට ඇත. | ආයතනවලට යොමු කිරීමට හෝ එම නිලධාරීන් කාර්යක්ෂමව හා ඵලදායීව සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 250 ක් වුවත් තථ්‍ය කාර්ය මණ්ඩලය 176 ක් වූයෙන් තනතුරු 74 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තුළ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 ක්, මධ්‍ය කළමනාකරණ මට්ටමේ තනතුරු 17 ක් හා කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 12 ක් පැවතුණි. එම හේතුවෙන් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද වැඩ බැලීමේ පත්වීමක් විය. | අදාල තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |